Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com

මොඩියුල අංක 03

පන්ති කාමර කළමනාකරණය හා ශිෂ්‍යයා හඳුනා ගැනීම

එම්. ඩී. කේ. ධම්මික,
කථිකාචාර්ය (SLTES-iii),
ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය,
මීගහතැන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

මොඩියුලයේ අරමුණු

- කළමනාකරණ සංකල්පය නිර්වචනය කර ඵලදායී පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලිය හඳුනා ගැනීම.
- ගුරුවරයා පන්ති කාමර ව්‍යවහාර ගුර සිසු දෙපිරිසට ම ප්‍රිය උපදවන පරිදි භාවිත කිරීම.
- විවිධ වයස් කාණ්ඩයන්ට අයත් ශිෂ්‍යයින්ගේ ගති ලක්ෂණ හඳුනා ගැනීම.
- ළමයා හා පරිසරය, ළමා වර්ධනය, අවශ්‍යතා අධ්‍යයනය කරමින් ළමා චර්යාවන් හඳුනා ගැනීමේ ක්‍රමවේද භාවිත කිරීම.
- පන්ති කාමරය තුළ සිසුන්ගෙන් මතු වන අභියෝගාත්මක චර්යාමය ගැටලු කළමනාකරණය කිරීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

අපේක්ෂිත ඉගෙනුම් ඵල

- පන්ති කාමර කළමනාකරණය යන්න කුමක් දැයි පැහැදිලි ව ප්‍රකාශ කරයි.
- කළමනාකරණ ක්‍රියාවලියේ පියවරයන් විධිමත් ව පන්ති කාමර කටයුතුවල දී භාවිත කරයි.
- පන්ති කාමර කළමනාකරුවකු වශයෙන් ගුරුවරයාගේ කාර්යභාරය කාර්යක්ෂම ව හා ඵලදායී ව ක්‍රියාත්මක කරයි.
- පන්ති කාමරය තුළ මතු වන සිසුන්ගේ අභියෝගාත්මක චර්යා ගැටලු අවස්ථෝචිත පරිදි කළමනාකරණය කරයි.
- පන්ති කාමරයේ දී හමු වන සිසුන් චර්යාමය විවිධතා අනුව හඳුනා ගනී.
- සිසුන්ගේ විවිධතාවලට ගැළපෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස මෙහෙයවයි.

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com

අනුමාතෘකා

- පන්ති කාමර කළමනාකරණය
- පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලිය
- පන්ති කාමර කළමනාකරුවකු වශයෙන් ගුරුවරයා
- ශිෂ්‍යයා හඳුනා ගැනීමේ වැදගත්කම
- ශිෂ්‍යයා හඳුනා ගැනීම
- ළමා සංවර්ධනය
- ශිෂ්‍යයා හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි උපකරණ
- විශේෂ අවශ්‍යතා ඇති සිසුන් හඳුනා ගැනීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

පළමු වන සිද්ධිය

- 3 වන ශ්‍රේණියේ සිසුන්ට හැඩතල හඳුනා ගැනීමේ පාඩමක් ඉගැන්වීමට ගුරුවරියකට අවශ්‍ය විය. මේ සඳහා ඇය විවිධ හැඩතල කට්ටල කිහිපයක් ගෙනැවිත් තිබුණි. සමහර ඒවා ඝන කඩදාසිවලින් සකසා තිබුණි. ඇය මේ සියල්ල පන්තියට ගෙන ගොස් මේසය මත තබා පාඩම ආරම්භ කළා ය. එක් එක් හැඩය පෙන්වමින් හැඩ හඳුන්වා දුන්නා ය. මේ අතරතුර සිසුහු දෙදෙනෙක් නැගිට මේසය ළඟට පැමිණ හැඩතල දෙස ආශාවෙන් බලා සිට කිහිපයක් අතට ගත්හ. ඉන් පසු අසල ම කණ්ඩායම පැමිණ කිහිපයක් රැගෙන ගොස් වාඩි වූහ. තවත් කිහිප දෙනෙක් නැගිට මේසය වටා රොක් වූහ. පන්තිය කලබලකාරී විය. අසල්වැසි පන්ති ගුරුවරිය ද දොර ළඟට විත් බාධාකාරී බව ඇඟෙව්වා ය. එවිට ගුරුවරිය නිශ්ශබ්ද ව වාඩි වෙන්න යැයි සිසුන්ට අවවාද දුන්නා ය. මේ අතර සීනුව නාද විය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

දෙවන සිද්ධිය

පද්මා නමැති ගුරුවරිය පන්තියට පැමිණියා ය. ළමෝ නැගිට "සුබ උදෑසනක් වේවා!" යැයි ප්‍රාර්ථනා කළහ. ඇය ද පෙරළා ඔවුන්ට සුබ පැතුවා ය. එදින භාෂා ප්‍රහේලිකා සම්බන්ධ තරගයක් පැවැත්වීමට නියමිත ව තිබිණ. පන්තිය වර්ණ දෙකක් අනුව කාණ්ඩ දෙකකට බෙදන ලදි. එක් එක් කණ්ඩායමට නමක් දී එකිනෙකාට මුහුණ ලා අසුන් ගැනීමට සලස්වන ලදි. ඉන් පසු ගුරුවරිය පහත දැක්වෙන උපදෙස් ලබා දුන්නා ය. "මම සෑම කෙනෙක්ට ම ප්‍රශ්නයක් ලියා ඇති කාඩ්පත බැගින් දෙනවා. එක් කෙනෙක් අනිත් කණ්ඩායමේ සාමාජිකයෙක්ට ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න ඕනෙ. සෑම නිවැරදි උත්තරයකට ම ලකුණු 10ක් ලැබෙනවා." සෑම කෙනෙකුට ම ප්‍රශ්න ඇසීමට හා උත්තර දීමට අවස්ථාව දෙන ලදි. අවසානයේ දී ගුරුවරිය ලකුණු එකතු කොට ජයග්‍රාහක කණ්ඩායමට තිළිණයක් ප්‍රදානය කළා ය. ඒ සමග ම පිළිතුරු දීමට අපහසු වූ තැන් ද පැහැදිලි කර දෙන ලදි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

කළමනාකරණය යනු කුමක් ද?

"කළමනාකරණය යනු සෙසු අය ලවා වැඩ කරවා ගැනීමේ කලාවයි."

– මේරි පාකර් ෆොලේට් (1868 - 1933)

"කළමනාකරය යනු වෙනස් වන පරිසරයක් තුළ සංවිධාන අරමුණු ළඟා කර ගැනීම සඳහා සෙසු අය සමග වැඩ කිරීමත්, සෙසු අය ලවා වැඩ ගැනීමත් හා සම්බන්ධ ක්‍රියාවලියයි."

– රොබට් ක්‍රීට්නර්

"කළමනාකරණය යනු සංවිධානයක අරමුණු ඉටු කර ගැනීම සඳහා එම සංවිධානයෙහි තිබෙන මානව සහ අනෙකුත් සම්පත් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම යන කාර්යයන් ඇතුළත් ක්‍රියාවලියයි."

– ස්ටෝනර්, ෆ්‍රීමන් සහ ගිල්බර්ට්, 1990

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

“සිසුන් සහිත පන්තියක් මනා ව හසුරුවා ගෙන යාම පන්ති කළමනාකරණය ලෙස හැඳින්විය හැකි ය. පන්ති කළමනාකරණය යන සංකල්පය පන්ති පාලනයට වඩා වෙනස් වූ පුළුල් කර්තව්‍යයකි. පාලනය යන්න කළමනාකරණයේ දී එක් කාර්යයක් පමණි. එහෙත් පන්ති කළමනාකරණයේ දී සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම, පාලනය, සම්බන්ධීකරණය, ගෘහ පාලනය, පෝෂණය ආදි විවිධ කළමනාකරණ කටයුතු කිරීමට සිදු වේ.”

– ජොන්සන් සහ බෲක්, 1997

“හිතකර චර්යා උපස්තම්භනය කිරීමෙන් ද අහිතකර චර්යා නිරුන්ධනය කිරීමෙන් ද පන්ති කාමර පරිසරය සක්‍රීය ලෙස පාලනයට නතු කිරීමේ ක්‍රියාවලිය පන්තිකාමර කළමනාකරණය වේ.”

– ගිබ්සන් 1981

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

කළමනාකරණ ක්‍රියාවලිය

- කළමනාකරණ ක්‍රියාවලිය එකිනෙකට සම්බන්ධ කාර්යයන් (කළමනාකරණ ශ්‍රිත) සමූහයකින් සමන්විත වේ.

- හෙන්රි ෆයෝල් (Henry Fayol) විසින් 1916 දී ඉදිරිපත් කරන ලද පරිපාලන න්‍යායට අනුව කළමනාකරණ ක්‍රියාවලිය හා සම්බන්ධ කාර්ය පහකි.
  - සැලසුම්කරණය
  - සංවිධානකරණය
  - අණ කිරීම
  - සම්බන්ධීකරණය
  - පාලනය කිරීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- ස්ටෝනර්ට අනුව කළමනාකරණ ක්‍රියාවලිය හා සම්බන්ධ කාර්යයන් මෙසේ ය.
  - සැලසුම් කිරීම
  - සංවිධානය කිරීම
  - මෙහෙයවීම
  - පාලනය කිරීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- වර්තමානයේ බොහෝ කළමනාකරුවන් හා දාර්ශනිකයින් කළමනාකරණ කාර්යය කොටස් හතරකට ගොනු කර තිබේ.
  - සැලසුම්කරණය (Planning)
  - සංවිධානකරණය (Organizing)
  - නායකකරණය (Leding)
  - පාලනය (Controlling)

- මෙම මූලික කාර්යයන් අධ්‍යාපන ක්ෂෙත්‍රයේ දී පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලියට ද සමීපතාවක් පෙන්වයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සැලසුම්කරණය

- අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා අවිනිශ්චිතභාවය සම්බන්ධ ක්‍රියාකාරකම් ගොඩ නැගීමේ ක්‍රියාවලිය සැලසුම්කරණයයි.
- ඉලක්ක ළඟා කර ගැනීමට මෙමගින් මග පෙන්වයි.
- කළමනාකරණයේ වැදගත් ම හා මූලික ම කාර්යය සැලසුම්කරණයයි.
- සෙසු කළමනාකරණ කාර්යයන් සඳහා පදනම දැමෙන්නේ මෙමගිනි.
- සැලසුම්කරණ කාර්යයේ දී අරමුණු පිහිටුවා ගැනීම, අරමුණුවලට අදාළ ව වර්තමාන තත්ත්වය නිශ්චය කිරීම, අනාගත තත්ත්වයන් පිළිබඳ පුරෝකථනයන් දියුණු කිරීම, උපකාරී සැලසුම් පිළියෙළ කිරීම, සැලසුම් ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිඵල ඇගයීම සිදු වේ.
- අවසානයේ සත්‍ය ප්‍රතිඵල හා අපේක්ෂා කරන ප්‍රතිඵල සැසඳීම වැදගත් කාර්යයකි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සංවිධානය

- පොදු පරමාර්ථයක් හෝ පරමාර්ථ කිහිපයක් ළඟා කර ගැනීම සඳහා පුද්ගලයින් දෙදෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් සාමුහික ව එකට වැඩ කිරීමේ ක්‍රියාවලිය සංවිධානය නම් වේ.

- පරමාර්ථවලට ළඟා විය හැකි පරිදි සංවිධානයේ සාමාජිකයින් අතර සම්පත් බෙදා හැරීමේ ක්‍රියාවලිය ද මීට අයත් වේ.

- සංවිධානකරණයේ දී ආයතනයේ සෑම පුද්ගලයකු ම අතර අදාළ කාර්ය කොටස හා අධිකාරිය පැවරීම සිදු වේ. මෙහි වාසි කිහිපයකි.
  - ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා පුද්ගලයින් සම්බන්ධීකරණය කර ගැනීම හා ඔවුන්ගේ උපරි ම හැකියාවන් හා පරිශ්‍රමයන් ලබා ගැනීමට හැකි වීම.
  - ද්විත්ව ගණනය වැළැකීම.
  - පුද්ගල කණ්ඩායම් අතර ගැටුම් අවම වීම.
  - සම්පත් නාස්තිය අඩු වීම.

- ආයතනයක කටයුතුවල මනා සන්නිවේදනය, පාලනය සඳහා සංවිධානකරණය ප්‍රබල පිටිවහලකි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

නායකකරණය

- නායකත්වය යනු සංවිධානයක අරමුණු ළඟා කර ගැනීම සඳහා යටත් අයට ඔවුන්ගේ රාජකාරි සූදානමින්, හැකියාවකින් හා උනන්දුවෙන් ඉටු කිරීම පිණිස බලපෑම් කිරීමේ කලාවයි.

- මෙහි දී අන්‍යයින්ගෙන් කටයුතු කර ගැනීමේ දී, බලපෑම් කිරීමේ දී සේවක අභිප්‍රේරණය ඉතා වැදගත් වේ.

- සේවක අභිප්‍රේරණය (Employee Motivation) යනු සංවිධාන පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා සේවකයින් ස්වේඡාවෙන් ම පෙලඹවීමේ කළමනාකරණ ක්‍රියාවලියයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **නායකත්ව වර්ග**

1. **විධිමත් නායකත්වය** (Formal Leadership)

පුද්ගලයකු විසින් උසුලන තනතුර ඔස්සේ ඔහුට ලැබෙන අධිකාරියයි.

2. **අවිධිමත් නායකත්වය** (Informal Leadership)

පුද්ගලයකුට ලැබෙන අධිකාරි බලයට අමතර ව ඔහු හෝ ඇය විසින් අන්තර් පුද්ගල සබඳතා පවත්වා ගෙන යාමේ දී කළ හැකි බලයයි.

මෙම නායකත්වය සඳහා පුද්ගලයා සතු අවංකකම, සමාජශීලී බව, ඉවසීම, බුද්ධිය, විශේෂ හැකියාවන් වැනි ගුණාංග හේතු වේ.

සාර්ථක කළමනාකරුවා විධිමත් හා අවිධිමත් නායකත්ව ශෛලීන් දෙක ම ඵලදායී ලෙස භාවිත කරයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- සෑම කළමනාකරුවකු ම සාර්ථක නායකයකු විය යුතු වේ.
- මේ සඳහා විවිධ නායකත්ව න්‍යායන් හා නායකත්ව ශෛලීන් භාවිත කෙරේ.
- නායකත්වය ශෛලීන්
  - ආඥාදායක නායකයා
  - ප්‍රජාතන්ත්‍රවාදී නායකයා
  - වන්නාටවාදී නායකයා

ආඥාදායක නායකයා

- තමා ම පමණක් පාලනය, අධීක්ෂණය හා තීරණ ගැනීම සිදු කරයි.
- සෙසු අය සහභාගි කර නොගනී.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ප්‍රජාතන්ත්‍රවාදී නායකයා

- සෙසු අයට නිතර උදවු කරයි.
- බලතල පවරයි.

වන්නාටවාදී නායකයා

- ආයතනයට වඩා තමන්ගේ ආරක්ෂාව ගැන සිතයි.
- අවම මට්ටමින් කටයුතු කර වගකීමෙන් ගැලවීමට උත්සාහ දරයි.
- සොයා බැලීම අනවශ්‍ය යැයි සිතයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

පාලනය

- සත්‍ය ප්‍රතිඵල, අපේක්ෂිත ප්‍රතිඵලවලට එකඟ බව තහවුරු කිරීමේ ක්‍රියාවලිය පාලනය නම් වේ.
- ආයතනයේ පරමාර්ථ ඉටු වන ලෙස එහි කටයුතු තහවුරු කර ගැනීම පාලන කාර්යය මගින් සිදු වේ.
- පූර්ණ තත්ත්වය කළමනාකරණය (Total Quality Management) නූතන සමාජය පිළිගනු ලබන වැදගත් පාලන ක්‍රමයකි.
- පාලන කාර්යයේ දී ආයතනය අපේක්ෂා කරන තත්ත්වයෙන් වෙනස් වීම හඳුනා ගෙන ඒවා නිවැරදි කර ගැනීමේ ක්‍රියාව සිදු වේ.
- සැලසුමේ දී පිහිටුවන ලද සංවිධාන අරමුණු පදනම් කොට කාර්යඵල ප්‍රමිතීන් පිහිටුවීම, සත්‍ය කාර්යඵල මැනීම, සත්‍ය කාර්යඵල ප්‍රමිතීන් සමග සැසඳීම හා ඒ සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම සිදු වේ.
- අවසානයේ සැලසුමේ පිහිටුවන ලද අරමුණු සමග සසඳනු ලැබේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

පාලනය තුළින් සිදු වන වාසි

- සංවිධානයේ කටයුතු කාර්යක්ෂම ව ඉටු කර ගැනීමට හැකි වීම.
- අඛණ්ඩ ව, ගුණාත්මක බව තහවුරු කර පවත්වා ගෙන යාම.
- තරගකාරිත්වයට සාර්ථක ව මුහුණ දීම.
- කඩිනමින් සේවා ලබා ගැනීම.
- අගයයන් එකතු කිරීම.
- පුද්ගල හා කණ්ඩායම්වල කාර්යය සඵල බව මැන ගැනීමට හැකි වීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- පාලන වර්ග තුනකි.

1. ඉදිරි පෝෂණ පාලනය – ගැටලු ඇතිවීම වැළැක්වීමට පියවර ගැනීම.
2. සමගාමී පාලනය – දැනට සිදු වන කටයුතු හා ක්‍රියාවලීන් සැලසුම් කිරීම.
3. ප්‍රතිපෝෂණ පාලනය – විචල්‍යයන් හඳුනා ගැනීමෙන් පසු හේතු සොයා නිවැරදි ක්‍රියා මාර්ග ගැනීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- කළමනාකරණය පිළිබඳ පර්යේෂණ සිදු කළ පර්යේෂකයින්ට අනුව කළමනාකරුවකුගේ සාර්ථකත්වය කෙරෙහි බලපාන ප්‍රධාන විචල්‍ය තුනක් පවතී.

    1. කළමනාකරුවන්ගේ හැකියාව
    2. අභිප්‍රේරණය
    3. කළමනාකරණය සඳහා ඇති අවස්ථා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

පන්ති කාමර කළමනාකරණය

- ප්‍රියජනක ඉගෙනුමකට බාධාකාරී පන්ති වාතාවරණ හඳුනා ගනිමු: ඒ සඳහා විසඳුම් සොයමු

❖ 8 ශ්‍රේණියේ සිසුන්ගෙන් කොටසක් ගණිතය විෂයය සඳහා අඩු සාධන මට්ටමක් පෙන්වීම.

❖ 5 ශ්‍රේණියේ සිසුහු 30ක් සිටිති. පන්තියේ ඩෙස් පුටු 40 බැගින් ඇත. එක් කොණක දෘශ්‍යාධාරක රාශියක් අවිධිමත් ව තබා ඇත. අවශ්‍ය සම්පත් ඇති බවක් පෙනුණත් ඉඩකඩ ඇසුරුණු බවක් පෙනේ. පන්ති භාර ගුරුතුමිය පවසන්නේ මෙම පන්තියේ සිසුන් ඉගෙනීමට අලස බවයි.

❖ 10 ශ්‍රේණියේ ගණිත පාඩම් අවසානයේ දෙනු ලබන අභ්‍යාස ඉක්මනින් නිවැරදි ව නිම කරන සිසුන් කිහිප දෙනෙක් සිටිති. ඔවුහු වැඩ නිම කර ගුරුතුමියට අභ්‍යාස පෙන්වා අන් අය සමග කතා කරති. කඩදාසි කොළ පාස් කර ගනිති. අනෙක් අයට උසුළු විසුළු කරමින්, ගුරුතුමිය අභ්‍යාස පොත් බලන අතරතුර එහා මෙහා ඇවිදිති.

❖ 10 ශ්‍රේණියේ සාහිත්‍ය පාඩම උගන්වන ගුරුවරියට දෙපස පන්තිවල ඝෝෂාකාරී බව බහුල ව අත් විඳීම සිදු වේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

පන්ති කළමනාකරණයෙහි ලා ගුරු කාර්යභාරය

- ලේඛන හා වාර්තා පවත්වාගෙන යාම.
- ශිෂ්‍යයා හඳුනා ගැනීම.
- විනය පවත්වා ගැනීම.
- භෞතික හා මානව සම්පත් නිසි පරිදි භාවිතය.
- ප්‍රතිකාර්ය ඉගැන්වීම.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මනා ලෙස සංවිධානය කිරීම.
- විෂය සමගාමී කටයුතු පවත්වාගෙන යාම.
- ප්‍රජා සබඳතා නිසි පරිදි පවත්වා ගැනීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

විශේෂ අවශ්‍යතා සහිත සිසුන් හඳුනා ගැනීම

නිර්වචන

- සාම්ප්‍රදායික නිර්වචනය

"ප්‍රමාණයෙන් විශාල ලෙස උපකාර ලබා දිය යුතු ළමයින්, ආබාධිත හෝ දුර්වලතාවලින් පෙළෙන හෝ ඌනතා සහිත හෝ විශේෂ ළමයින් වේ."

- නූතන නිර්වචනය

"සියලු ම ළමයින්ට පොදු වූ අවශ්‍යතාවලට අමතර ව විශේෂ වූ අවශ්‍යතා ද ඇත. මේ අනුව සියලු ළමයින් විශේෂ අවශ්‍යතා සහිත ළමයින් ලෙස සැලකේ."

(රෝලන්ඩ් අබේපාල, අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්ම පදනම කෘතියෙන්– 2010)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වර්ගීකරණය

බුද්ධිමය වශයෙන්

- ❖ සුහග හා නිර්මාණශීලී
- ❖ ඉගෙනුම් මන්දගාමීන්
- ❖ මානසික ආබාධ ඇති නමුත් අධ්‍යාපනය ලැබිය හැකි

ශාරීරික වශයෙන්

- ❖ පෙනීම දුර්වල
- ❖ ඇසීම දුර්වල
- ❖ කථනය දුර්වල
- ❖ කොර
- ❖ මොළයේ ඇති ආබාධ (තුවාල)

චිත්තවේගීය වශයෙන්

- ❖ සමාජ අපචාරීන්

විවිධ ආබාධිතයින්

- ❖ එකකට වැඩි ගණනක් ආබාධ සහිත ළමුන්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

1944 බ්‍රිතාන්‍ය අධ්‍යාපන පනතට අනුව එරට විශේෂ අධ්‍යාපන සේවා අවශ්‍ය සිසුන්

- දෘශ්‍යාබාධිත
- රෝග ආබාධ සහිත
- ශාරීරික ඌනතා සහිත
- බිහිරි
- ශ්‍රවණාබාධිත
- කථනාබාධිත
- දුස්සමාහිත
- අධ්‍යයන පසුබට
- චිත්තවේගී ආබාධිත
- විශේෂ බුද්ධිමය ශක්‍යතා සහිත

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

අමෙරිකා එක්සත් ජනපදයට අනුව විශේෂ අවශ්‍යතා සහිත සිසුන් වර්ගීකරණය

- සුභග
- අධ්‍යාපනය ලැබිය හැකි මානසික පසුබටතා සහිත
- චිත්තවේගික
- දුස්සමාහිත
- ගොළු
- අන්ධ
- කථන ඌනතා සහිත
- ඇසීමේ දෝෂ සහිත
- පෙනීමේ දුබලතා
- කොර

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විශේෂ අවශ්‍යතා සහිත ළමුන් වර්ගීකරණ කර ඇති ආකාරය

- ❖ බුද්ධියෙන් අඩු (මන්ද මානසික)
- ❖ ඇසීම නැති හෝ අඩු (ශ්‍රවණාබාධිත)
- ❖ විවිධ කථන දෝෂ සහිත (කථනාබාධිත)
- ❖ පෙනීම නැති හෝ අඩු (දෘශ්‍යාබාධිත)
- ❖ කොර ආදී ශාරීරික බාධා (ශාරීරික ආබාධ)
- ❖ චර්යා පිළිබඳ ආබාධ සහිත (චර්යාබාධිත)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු වර්ගීකරණ ඇසුරින් විශේෂ අවශ්‍යතා සහිත සිසුන් ප්‍රධාන අංශ පහකට බෙදා වෙන් කළ හැකි වේ.

- කායික අභියෝග සහිත ශිෂ්‍යයෝ
- මානසික අභියෝග සහිත ශිෂ්‍යයෝ
- චර්යා අක්‍රමිකතා සහිත ශිෂ්‍යයෝ
- ඉගෙනුම් දුෂ්කරතා සහිත ශිෂ්‍යයෝ
- සුභග ශිෂ්‍යයෝ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

විශේෂ අවශ්‍යතා සහිත සිසුන් හඳුනා ගැනීමේ ක්‍රමවේද

- නිරීක්ෂණය
- පරීක්ෂණ අධ්‍යයනය
- ඇගයීම් ක්‍රමවේද භාවිතය

❖ නිරීක්ෂණය මගින් විශේෂ අවශ්‍යතා සහිත සිසුන් හඳුනා ගැනීමෙන් අනතුරු ව පරීක්ෂණ අධ්‍යයන හා ඇගයීම් ක්‍රමවේද භාවිතයෙන් ගැටලුවේ ස්වභාවයත්, එහි තීව්‍රතාවත් තහවුරු කර ගත හැකි වේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

දෘශ්‍යාබාධිත සිසුන් තුළින් දැකිය හැකි ලක්ෂණ

- ඇස් රතුවීම හෝ ඇස් ඉදිමීම.
- ඇස්වලින් නිතර ම කඳුළු ගැලීම.
- ඇස් ඉදිරියට නෙරා ගොස් තිබීම.
- ඇසි පිය හෙළීමේ දී දෑස ම එක විට සිදු නොවීම.
- කුඩා අකුරු කියවීමට නොහැකි වීම.
- පොත් ඇස් ළඟට කර හෝ ඈතට කර කියවීම.
- නිතර ඇස්වල වේදනාවක් පැවතීම.
- යමක් දෙස බැලීමේ දී හිස එහාට මෙහාට හරවමින් බැලීම.
- කියවීමේ දී හා ලිවීමේ දී තනි ඇසක් භාවිත කිරීම.
- නිරන්තරයෙන් හිසරදය පැවතීම.
- කළුලෑල්ලේ ලියන දේ පිළිබඳ වෙනත් සිසුන්ගෙන් විමසීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

දෘශ්‍යාබාධිත සිසුන්ගේ ඉගෙනුම් කාර්යය පහසු කිරීමට කළ හැක්කේ කුමක් ද?

- පන්තියේ සුදුසු ස්ථානයක සිසුවා ස්ථානගත කිරීම.
- කළු ලෑල්ල ආදිය භාවිත කිරීමේ දී අකුරු ලොකුවට ලිවීම.
- ලිඛිත දේ වාචික ව ද පැවසීම.
- අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර වෙත සිසුවා යොමු කිරීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ශ්‍රවණාබාධිත සිසුන් තුළින් දැකිය හැකි ලක්ෂණ

- සෑම විට ම අවධානයෙන් තොර ව පසු වීම.
- කටහඬ පැමිණෙන දිශාව හා කටහඬ කාගේ දැයි හඳුනා ගැනීම දුෂ්කර වීම.
- යමෙක් කතා කරන විට ඔහු ළඟට පැමිණ තොල් දෙස බලා සිටීම.
- භාවිත කරන වචන මාලාව ඉතා සීමිත වීම.
- යමෙක් පිටුපසින් සිට කතා කරන විට එයට ප්‍රතිචාර නොදැක්වීම.
- අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමට අපොහොසත් වීම.
- අස්වාභාවික උස් හඬකින් කතා කිරීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ශ්‍රවණාබාධිත සිසුන්ගේ ඉගෙනුම් කාර්යය පහසු කිරීමට කළ හැක්කේ කුමක් ද?

- ශ්‍රවණාබාධිත සිසුන් ඉදිරිපෙළ අසුන් ගැන්වීම.
- දෘශ්‍යාධාරක මගින් ඉගැන්වීම.
- මුද්‍රිත සටහන් ආදිය ලබා දීම.
- පාඩම පැහැදිලි කිරීමේ දී වාචික ක්‍රම මෙන් ම ලිඛිත ක්‍රම ද උපයෝගී කර ගැනීම.
- ඇගයීම් අවස්ථාවේ දී ලිඛිත පිළිතුරු ලබා දීමට අවස්ථාව සැලසීම.
- වෛද්‍ය උපදෙස් සඳහා ශිෂ්‍යයා යොමු කිරීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

කථනාබාධිත සිසුන් තුළින් දැකිය හැකි ලක්ෂණ

- ඇතැම් අකුරු වෙනුවට වෙනත් අකුරු උච්ඡාරණය කිරීම.
- වචන උච්ඡාරණයේ දී ඇතැම් අකුරු ගිලිහී යාම.
- ඇතැම් වචන විකෘති ලෙස උච්ඡාරණය කිරීම.
- හඬ නගා කතා කිරීමට නොහැකි වීම.
- කතා විලාසය අපැහැදිලි වීම.
- කතා කිරීමේ දී ගොත ගැසීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

කථනාබාධිත සිසුන්ගේ ඉගෙනුම් කාර්යය පහසු කිරීමට කළ හැක්කේ කුමක් ද?

- ඇගයීම් කාර්යයේ දී වාචික පිළිතුරු වෙනුවට ලිඛිත පිළිතුරු ලබා ගැනීමට වැඩි වශයෙන් යොමු වීම.
- හඬ නගා කියවීම වෙනුවට නිහඬ ව කියවීම වැනි ක්‍රමවේද කෙරෙහි එවැනි සිසුන් යොමු කිරීම.
- හඬ පුහුණුව මගින් කථන දුබලතාව අවම කර ගැනීමට හැකියාවක් පවතින්නේ නම් ඒ සඳහා සුදුසු අභ්‍යාස ලබා දීම.
- වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා සිසුවා යොමු කිරිම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සුහග ළමයි

- පන්තියේ සිසුන් අතර වඩාත් විශිෂ්ට කුසලතා දක්වන අතිදක්ෂ සිසුන් සුහග (Gifted) ලෙස හැඳින්වේ.
- සුහග භව මැනීමට බුද්ධිඵලය (I.Q) යොදා ගනී.
  - ටර්මන්ට අනුව බුද්ධිඵලය 140ට වැඩි
  - සිරිල් බර්ට්ට අනුව බුද්ධිඵලය 125ට වැඩි
  - ලොවල්ට අනුව බුද්ධිඵලය 130ට වැඩි
  - හොලිංවර්ත්ට අනුව බුද්ධිඵලය 170ට වැඩි

  සිසුහු සුහගයෝ වෙති.
- සුහග දරුවන් තුළ හැම විට ම ඔවුන්ගේ ජන්ම වයසට වඩා මානසික වයස ඉදිරියෙන් පවතී.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

මාග්‍රට් පාකර්ට අනුව (1982) සුහග ළමයින්ගේ ආවේණික ලක්ෂණ

- උපතේ සිට ම අන් ළමයින්ට වඩා ක්‍රියාශීලී ය.
- අඩු වයසින් කතාව අරඹයි.
- අවට පරිසරය ගැන උනන්දුව දක්වයි.
- වැඩි ආත්ම විශ්වාසයක් ඇත.
- හොඳ මතකයක් වේ.
- චිත්තවේගික කැලඹිලි අඩු යි
- ස්වාධීන ව කටයුතු කිරීමට වඩා කැමැති වෙයි.
- අන්තර්පුද්ගල හා සමාජමය කටයුතුවල දී කැපී පෙනේ.
- පොතපත කියවීමට වැඩි කැමැත්ත දක්වයි.
- බුද්ධිමය ක්‍රීඩාවලට වැඩි කැමැත්ත දක්වයි.
- විද්‍යාත්මක දේ එක් රැස් කිරීමට කැමැත්ත දක්වයි.
- තනිව ක්‍රීඩා කරයි.
- වයසින් වැඩි අය සමග ක්‍රීඩාවට කැමැත්ත දක්වයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සුභග බව හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි පරීක්ෂණ වර්ග

- පුද්ගල බුද්ධි පරීක්ෂණ
- කණ්ඩායම් බුද්ධි පරීක්ෂණ
- නිර්මාණාත්මක පරීක්ෂණ
- අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණ
- අභියෝග්‍යතා පරීක්ෂණ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සුහග ළමයින් සංවර්ධනය කිරීමේ දී අනුගමනය කළ හැකි විවිධ ප්‍රවේශ

- එක වර ද්විත්ව ශ්‍රේණි සාමර්ථ්‍ය ලබා දීම.
- ඉගෙන ගන්නා විෂය මාලාව පෝෂණය කිරීම.
- සුහගයින් සඳහා විශේෂිත විෂයමාලා සකස් කොට ඉගැන්වීම.
- සුහගයින් වැඩි උනන්දුවක් දක්වන විෂයයන් පුළුල් ව හැදෑරීමට අවස්ථාව සැලසීම.
- අඩු වයසින් පාසලට ඇතුළත් කර ගැනීම.
- විභාග/තරගවලට ඉදිරිපත් වීමේ දී අවම වයස් සීමාවෙන් නිදහස් කිරීම.
- පන්ති කාමරයේ දී ම සුහග ශිෂ්‍යයාට අමතර පෝෂණය ලබා දීම.
- අධ්‍යාපන සම්පත් කාමර (Resource rooms) සැපයීම.
- සුහග සිසුන් වෙන් කොට ඉගැන්වීම.
- සුහගයින් සඳහා විශේෂයෙන් පුහුණු කළ ගුරුවරුන් යෙදවීම.
- සුහග සිසුන් තෝරා විශේෂ පාසල් පැවැත්වීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සුහග ළමයින් පන්ති කාමරය තුළ සංවර්ධනය කිරීම

- පන්තියේ පොදු ඉගැන්වීමට අතිරේක වශයෙන් විෂයමාලා ආශ්‍රිත අමතර දැනුම සෙවීමේ ව්‍යාපෘතිවල සුහග සිසුන් යෙදවීම.
- දිනපතා පුවත්පත් සඟරා හා විෂය ආශ්‍රිත නව දැනුම ඇතුළත්, සමාන්තර ශ්‍රේණි මට්ටමේ පුස්තකාල ඇති කොට ඒ සඳහා සුහග සිසුන් යොමු කිරීම.
- නායකත්වය, මෙහෙයවීම හා උපකාර කිරීම වැනි දක්ෂතා වැඩෙන පරිදි සුහග සිසුන්ගේ දක්ෂතාවලින් පන්තියේ සෙසු සිසුන්ට උපකාර කිරීම.
- විශේෂ දක්ෂතා වැඩි දියුණු වන පරිදි විවිධ ප්‍රසංග, නාට්‍ය නිෂ්පාදනය, සාහිත්‍ය උළෙල, භාෂා දිනය ආදී විවිධ උත්සව, සමිති හා වැඩසටහන් මෙහෙයවීමේ වගකීම පැවරීම.
- කාණ්ඩ ක්‍රමය භාවිත කිරීමේ දී සුහග සිසුන් කණ්ඩායම් නායකත්වයට හා වගකීම් දැරීමට පත් කිරීම.

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com
Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- සාමාන්‍ය විෂයමාලා ආශ්‍රිත කරුණුවලට අමතර ව තව දුරටත් සොයා බැලීම පිණිස කරුණු සොයා යෑම, සමීක්ෂණය හා නිරීක්ෂණය පැවැත්වීම වැනි අමතර වැඩවලින් පෝෂණය කිරීම.

- පරිකල්පනය, නිර්මාණාත්මක බව වැනි දක්ෂතා හඳුනා ගෙන ඊට උචිත පරිදි සාහිත්‍ය පොතපත කියවීමට අනුබල දීම හා නාට්‍ය, කෙටිකතා, පද්‍ය නිර්මාණයට යොමු කිරීම.

- පාසලක පවතින සාමාන්‍ය සමිති සමාගම්වලට අමතර ව, සුහග සිසුන්ගේ අවශ්‍යතාවට සරිලන පරිදි විශේෂ සාකච්ඡා, සංවාද, විවාද පවත්වාගෙන යාම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ඉගෙනුම් දුෂ්කරතා/ නොහැකියා සහිත ශිෂ්‍යයෝ

1. ප්‍රාථමික ඉගෙනුම් නොහැකියාව 2.සුවිශේෂී ඉගෙනුම් නොහැකියාව

- ප්‍රාථමික ඉගෙනුම් නොහැකියාව යනු නිවසේ දී හා පාසලේ දී අදාළ නිපුණතාව කරා ළඟා වීමට ශිෂ්‍යයාට නිසි මගපෙන්වීමක් නොලැබීමයි.

  උදාහරණ - පාසලේ ගුරුවරයකු නොමැති වීම.

- සුවිශේෂී ඉගෙනුම් නොහැකියාව යනු අදාළ නිපුණතාව කරා ළඟා වීමට ශිෂ්‍යයාට අවශ්‍ය වාතාවරණය පැවතිය ද නිපුණතාව වෙත ළඟා වීමට අපහසු වීමයි. මෙය මොළය ආශ්‍රිත ස්නායුමය ගැටලුවක්, සංජානනයේ අක්‍රමිකතා සහිත බවක් වන අතර ස්නායු පද්ධතිය හා මොළයේ රසායනික ක්‍රියාවලියේ ගැටලු සහගත තත්ත්වයක් මෙයට හේතු විය හැකි ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ඉගෙනුම් දුෂ්කරතා/ නොහැකියා සහිත ශිෂ්‍යයින්ගේ ලක්ෂණ

- ලිවීමේ දී
  - අපැහැදිලි ලෙස ලිවීම.
  - වචනයක අකුරු මාරු කර ලිවීම.
  - අකුරු අනෙක් අතට ලිවීම.
  - වැරදි අක්ෂර වින්‍යාසය.
  - පේළියේ ලිවීමට නොහැකි වීම.
  - ඉතා සෙමෙන් ලිවීම.
  - නියමිත හැඩයෙන් නොලියවීම.

- කියවීමේ දී,
  - අකුරෙන් අකුර තතන තතනා කියවීම.
  - වචන ආපස්සට කියවීම.
  - අකුරු අත හැර කියවීම.
  - පේළි අත හැර කියවීම.
  - එක ම වචනය නැවත නැවත කියවීම.
  - කියවූ පේළිය නැවත කියවීම.
  - වෙනත් වචන කියවීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- ගණිතයේ දී,
  - සංඛ්‍යා පිළිබඳ අනවබෝධය.
  - ඉලක්කම් මාරු කර කියවීම.
  - මූලික ගණිත කර්ම පටලවා ගැනීම.
  - වචනයෙන් ප්‍රකාශ වන ගණිත ගැටලු අවබෝධ කර ගැනීමට නොහැකි වීම.

අවධාන ඌනතා/ අධික්‍රියාකාරී ළමුන් හඳුනා ගැනීම

- අත් පා නිතර සොලවමින් සිටී.
- වැඩි වේලාවක් එක දිගට වාඩි වී සිටිය නොහැක.
- බාහිර ප්‍රබෝධක නිසා ඉක්මනින් කැලඹිල්ලට පත් වේ.
- ප්‍රශ්නයක් අසා නිමවීමට පෙර පිළිතුරු දෙයි.
- උපදෙස් අනුගමනය කිරීම අපහසු ය.
- අන් අයට නිතර ම බාධා කරයි.
- එක් වැඩක් එක දිගට කර ගෙන යාමට නොහැකි වෙයි.
- එක් වැඩක් අවසන් නොකොට වෙනත් වැඩකට මාරු වෙයි.
- එක් තැනක ක්‍රීඩා කිරීමට අපහසු ය.
- අධික ලෙස කතා කරයි.
- අන් අයට ඇහුම්කන් දීම දුර්වල ය.
- විපාක නොසලකා අවදානම් ක්‍රියාවල නිරත වේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

අවධාන ඌනතා සහිත සිසුන් සමග කටයුතු කිරීමේ දී ගුරු කාර්යභාරය

- කාර්යයේ දිග අඩු කිරීම.
- පියවර ක්‍රමයට පාඩම සිදු කිරීම.
- කාර්යය රසවත් පරිදි සැකසීම.
- දිගු වේලාවක් වැඩක නිරත වීමෙන් පසු අලුත් දෙයක් සිදු කිරීමට සිසුන් යොමු කිරීම.

අධික්‍රියාකාරී සිසුන් සමග කටයුතු කිරීමේ දී ගුරු කාර්යභාරය

- දිගු කාලයක් වාඩි වී වැඩ කරන්නේ නම් එක් වැඩ කොටසක් අවසන් වූ පසු පන්තියේ කෙටි වේලාවක් ඇවිදීමට දීම.
- තෑගි ලෙසට ක්‍රියාකාරකම් යොදා ගැනීම.
- ක්‍රියාශීලී ක්‍රියාකාරකම් සැකසීම.
- නායකත්වයට ඉඩ සැලසීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ප්‍රචණ්ඩකාරී හැසිරීම් සහිත ළමුන් හඳුනා ගැනීම

- ඉක්මන් කෝපය පැවතීම.
- සුළු දෙයටත් නොසන්සුන් වීම.
- අපිළිවෙළ.
- රණ්ඩු දබර වීම.
- අන්‍යයන්ට විරුද්ධ ව පැමිණිලි කිරීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

හුදකලා වූ ළමුන් හඳුනා ගැනීම

- දවල් සිහින දැකීම.
- උදාසීන බව.
- ඉක්මන් කෝපය පැවතීම.
- සුළු දෙයටත් නොසන්සුන් වීම.
- අපිළිවෙළ.
- රණ්ඩු දබර වීම.
- අන්‍යයන්ට විරුද්ධ ව පැමිණිලි කිරීම.
- අඩුවෙන් ප්‍රතිචාර දැක්වීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ප්‍රචණ්ඩකාරී හැසිරීම් සහිත සිසුන් හා හුදකලා වූ සිසුන් සමග කටයුතු කිරීමේ දී ගුරු කාර්යභාරය

- ගුරුවරයා ආසන්නයේ වාඩි කරවා ගැනීම.
- ආදරණීය ආමන්ත්‍රණය.
- සහභාගිත්වය ඇති වන පරිදි කණ්ඩායම් ක්‍රියාකාරකම්/භූමිකා රංගන ඇති කිරීම.
- යහ හැසිරීම් දිරිමත් කිරීම.
- සතුටින් පිරි පන්ති කාමර වාතාවරණය.
- දරුවාගේ දක්ෂතා අනුව විවිධ ක්‍රියාකාරකම්වල නිරත කරවීම.
- යහ චරිත ආකෘති පිළිබඳ අත්දැකීම් ලබා දීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

රතු රෝසමලට – බිම්මලට සම ව

සෙනෙහසේ සිසිල බෙදනා

ගුරුවරුන් පුදමු බැතිනා...

– ස්තූතියි –